# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2015/02 - 2017 අප්‍රේල් මස 17 වැනි සඳුදා - 2017.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2014/WS/192.
*මගේ යොමු අංකය* : WAR/LAN/ACQUS/A2/5-49.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ සංශෝධන පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙලිගල් කෝරළයේ සුළු කොට්ඨාශයේ 82ඒ තුල්හිරිය ග්‍රාම නිලධාරී වසමේ තුල්හිරිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට කෑගල්ල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2017.03.06 දිනැතිව පිළියෙල කර ඇති අංක මු. පි. කෑ. 3528, දරන පිඹුරේ කැබලි අංක 01 දරන ප්‍රමාණයෙන් හෙක්. 0.1736 ක් වූ පහත විස්තර කරන ඉඩම් කැබැල්ල :

**කැබලි අංක 01**

ඉඩමේ නම: ඕවිටේවත්ත; ඉඩමේ විස්තරය: ලඳු කැළය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: ඒ. ඒ. එම්. පී. අමරසිංහ, අංක 60/1, නයිවල එස්සැල්ල; ප්‍රමාණය: හෙක්. 0.1736.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 ජූනි මස 28 වැනි දින පෙ. ව. 10.00ට වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2017.06.21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ලක්ෂ්මේන්ද්‍ර දමයන්ත් කුමාර තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
වරකාපොල.

2017 අප්‍රේල් මස 06 වැනි දින,
වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05– 08

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම් යොමු අංකය* : 6/3/7/15/13/3/16.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : LD/05/2007/MV/108D.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 1891/37 හා 2014 දෙසැම්බර් මස 05 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද හු. මු. පි. 20, අතිරේක අංක 98, පත්‍රය 163 දරන සැලැස්මේ කැබලි අංක 4447 දරන ඉඩම් කොටසේ ප්‍රමාණය හෙක්. 0.1123 ලෙස සඳහන් වුවද එය හෙක්. 0.1103 යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ආර්. බී. එන්. බී. කරුණාතිලක,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2017 මාර්තු මස 30 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05– 09

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.